MONEY
&
FINANCIAL INSTITUTIONS
(Part-III)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

ශ්‍රී ලංකා මහ බැංකුව

1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු මස 28 වෙනි දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරනු ලබන කේන්ද්‍රීය ආයතනය වේ.

එහි ආරම්භක අධිපතිවරයා වූයේ ජෝන් එක්ස්ටර් මහතා ය.

පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයක් මගින් මහ බැංකුවේ සංවිධාන කටයුතු සිදු කෙරෙන අතර, එම මුදල් මණ්ඩලය, මහ බැංකු අධිපති, මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා පත්කළ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

ClassWork.LK

ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන අරමුණු

- ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගෙන යාම

- මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම

ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගෙන යාම

දේශීය මුදලේ අගය ස්ථාවර ව පවත්වා ගැනීම හෙවත් සුරක්ෂිත කිරීම මිල ස්ථායීතාව වේ. මේ තුළින් උද්ධමන හා අවධමන තත්ත්වයන්ගෙන් තොර ව ආර්ථිකය පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. උද්ධමනය අඩු මට්ටමක පවතින විට ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වේ. තිරසර ආර්ථික වර්ධනයක් හා ඉහළ සේවා නියුක්තියක් ඇති කිරීමට මෙය ඉවහල් වේ.

ClassWork.LK

මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම

ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ලෙස හැඳින්වේ. එනම් මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව ඇති කිරීම, ස්ථායීතාවට එල්ල විය හැකි තර්ජන හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම තුළින් මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමේ හැකියාව ඇත. මෙ මගින් තැන්පත්කරුවන්ට හා ආයෝජකයින්ට යන දෙපාර්ශ්වයට ම හිතකර වාතාවරණයක් උදා කෙරේ.

ClassWork.LK

ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා නියැලෙන කාර්යයන්

- මුදල් ප්‍රතිපත්ති මෙහෙය වීම
- විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙය වීම
- ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය
- ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම
- බැංකු හා බැංකු නො වන ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම
- රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු සහ මූල්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම
- මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වා ගෙන යන වාණිජ බැංකුවලට හා ප්‍රාථමික වෙළෙඳුන්ට නිෂ්කාශන සහ පියවීමේ පහසුකම් සැපයීම

ClassWork.LK

මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන්

- රාජ්‍ය ණය කළමනාකරණය

- විදේශ විනිමය පාලනය

- කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම

- සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය

ව්‍යාපාරවල ආයෝජනය කිරීම පිළිබඳ ව සුරක්ෂිතතාව ඇති වීම, මූල්‍ය ගනුදෙනු පහසු වීම හා කාර්යක්ෂම වීම සිදු වන බැවින් ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය හා දිගුකාලීන පැවැත්ම සඳහා මහ බැංකුවේ කාර්යයන් දායක වේ.

ClassWork.LK

<u>මූල්‍ය යටිතල පහසුකම්</u>

<u>ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය - ස්ලිප්ස් (Sri Lanka Inter - Bank Payment System - SLIPS)</u>

පරිගණක භාවිත කරමින් බැංකු අතර සිදු වන ගනුදෙනු පියවීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ මෙම අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවට හා වාණිජ බැංකුවලට හවුල් අයිතියක් ඇති සීමා සහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම වෙත පවරා දෙන ලදී.

ClassWork.LK

සීමාසහිත ලංකා ක්ලියර් (පෞද්.) සමාගම විසින් ඉටු කරන නිෂ්කාශන සේවා

- චෙක්පත් හා අණකර හවු මාරුව හා ශුද්ධ ශේෂය ගණනය කිරීම

- එම ශුද්ධ ශේෂ මහ බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු වෙත දැනුම් දීම

- ලංකා ක්ලියර් පුද්ගලික සමාගම විසින් "ලංකාපේ " (Lankapay)යන සන්නම් නාමය යටතේ ගනුදෙනු සඳහා පොදු කාඩ්පතක් හඳුන්වා දී ඇත.

ClassWorkLK

<u>ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය - ස්විෆ්ට් සන්නිවේදන ජාලය</u>

<u>(SWIFT - Sri Lanka Worldwide Inter Bank Financial Telecommunication)</u>

නවීනත ම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කෙරෙන සන්නිවේදන ජාලයකි. මෙ මගින් ජාත්‍යන්තර වශයෙන් බැංකු අතර සිදු වන මුදල් පැවරුම් පිළිබඳ ව කටයුතු කරයි.

<u>තත්කාලීන දළ පියවීමේ පද්ධතිය</u>

<u>(RTGS - Real Time Gross Settlement system)</u>

ශ්‍රී ලංකාවේ බැංකු අතර වටිනාකම් අධික ගෙවීම් කාල පමාවකින් තොර ව උසස් තාක්ෂණය හා ප්‍රමිතීන් යොදා ගනිමින් පියවීම සඳහා පිහිටුවා ඇති පරිගණක ගෙවුම් ක්‍රමයයි. ඉතා සුළු කාලයකින් පියවිය හැකි විම නිසා මෙම ක්‍රමය වැදගත් වේ. මෙය රට තුළ ඇති එක ම විශාල වටිනාකම් සහිත ජාතික ගෙවීම් පද්ධතියයි.

ClassWork.LK

ලේඛන රහිත සුරැකුම් පද්ධතිය
(SSDS - Script less Securites Depository System)

මුද්‍රණය කරන ලද සුරැකුම්පත් සහතික භාවිතය වෙනුවට සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට අදාළ ගනුදෙනුවක් කිරීම සඳහා ලේඛන රහිත ව භාවිත වන ක්‍රමයයි. මෙය ලංකා සෙක්‍යු (Secure) යන නමින් ද හඳුන්වයි.

මුද්‍රිත සුරැකුම්පත් ළඟ තබා ගැනීමේ දී හා විකිණීමේ දී ආයෝජකයාට දැරීමට සිදු වන අවදානම මෙමගින් අහෝසි වේ.

ලංකා සෙට්ල් පද්ධතිය

ඉහත පද්ධති දෙක එක් ව ගත් විට ලංකා සෙට්ල් පද්ධතිය ලෙස හඳුන්වයි. (RTGS + SSDS = Lanka settle system)

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura